# රට වෙනුවෙන්

## නිව් සවුත් වේල්ස් ජර්මන් ශ්‍රී ලංකා කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමයෙන් ව්‍යාපෘති රැසක්

**පවස නොනවතින මහා සාගරයක් නොවී පවස නිවන "දිය දෝතක්" වීම කෙතරම් අගේදැයි අපට සිතුනේ මේ සිඩ්නි මෙල්බර්න් දෙනුවර අත්වැල් බැඳගෙන කෙරෙන දායකත්වය මගින් ඉදිරියට යන දික්වැල්ල උතුර මහා විද්‍යාලයේ සිසු සිසුවියන්ගේ නොපසුබට උත්සහය සහ එහි ප්‍රතිඵල දුටු විටය.**

ශ්‍රී ලංකාවේ දික්වැල්ල ප්‍රදේශයේ තෝරා ගත් පාසලක් දියුණු කිරීමේ ව්‍යාපෘතියක් මෙහෙයවන්නට නිව් සවුත් වේල්ස් ජර්මන් ශ්‍රී ලංකා කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමය තීරණයක් ගත් අතර මෙයට හේතුව සුනාමි ඛේදවාචකයෙන් දික්වැල්ල ප්‍රදේශයේ පාසල්වලට තදබල හානි සිදු වී තිබීමත් සහ ඒ ප්‍රදේශයේ බොහෝ පවුල්වලට කෙලින්ම හෝ වක්‍රව "සුනාමි" යෙන් ඇති වූ අතුරු ඵල බලපා තිබීමත්ය. සුළු සුළු අස්ථිර කර්මාන්ත වල නියැලෙන දෛනික ආදායමෙන් නඩත්තු වන, කුලභේදය තවමත් රජයන ඒ නිසාම දේශපාලකයන්ගේ ඇස නොගැටුන, ඉතාම අඩුවෙන් එසේ නැතිනම් කිසිසේත්ම රජයේ ආධාර නොලැබෙන එහෙත් නොපසුබට උත්සහය, ආත්ම ශක්තිය, ආත්ම විශ්වාසය, අපේ කම, අපේ හැදියාවන් අනූන සිසු සිසුවියන් පිරිසක් ඇති, විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලයක්, දෙමව්පිය වැඩිහිටි පිරිසක් වාසය කරන, මුහුදු සීමාවෙන් මදක් ඈත්ව ඒ නිසාම සුනාමියෙන් අලාභහානි නොවූ දික්වැල්ල උතුර මහා විද්‍යාලය මේ සඳහා තෝරා ගැනෙන්නේ, ඉතා ඉක්මනින් අලුත් වැඩියා කොට ප්‍රදේශයේ අනෙකුත් පාසල් වල සිසු සිසුවියන් සහ ගුරු මණ්ඩලය මෙම විදුහලට අනුයුක්ත කල හැකි බව අධ්‍යනයේදී හෙලිවූ බැවිනි. ප්‍රයෝජනයට ගත හැකි ගොඩනැගිලි ශ්‍රමදාන මගින් ප්‍රදේශයේ ජනතාවගේ සහයෙන් එහි ගිය ඕස්ට්‍රේලියානු ඉංජිනේරුවන්ගේ මග පෙන්වීම යටතේ ලහි ලහියේ පිලිසකර කෙරුනු අතර ඉතිරි ගරා වැටුනු ගොඩනැගිලි බිම හෙලා තට්ටු 3ක ගොඩනැගිල්ලක් අද වන විට ඉදිකොට තිබේ. වසර 2005 මාර්තු මස දරුවන් 420 ක් සඳහා එක වැසිකිලියක් පමණක් තිබූ පාසලට එම වසරේ ජූනි මස වන විට වැසිකිලි, පොත් පත්, අමතර උපකරණ වලට අමතරව පරිගණක පවා සැපයුනි.

මේ අතර ඕස්ට්‍රේලියානු අධ්‍යාපන විශේෂඥයන් ස්වේච්ඡාවෙන් තම වියදමින් දික්වැල්ල ප්‍රදේශයේ මාස ගණන් නැවතී සිටිමින් මෙම පාසලේ ගුරුවරුන් පුහුණු කිරීමේ යෙදුනි. අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය ධාරණ ශක්තිය වැඩිදියුණු කිරීමට අදාල මොළයේ ඒ ඒ අංශයෙන් උත්තේජනය කිරීම සඳහා වන ශාරීරික ක්‍රියාකාරකම්, ක්‍රීඩා තරඟ, මලල ක්‍රීඩා, දේශීය නැටුම්, ගැයුම්, වැයුම් කාල සටහන් වලට ඇතුලත් කෙරිනි.

හෙට දිනයේ රටේ හැඩතල වෙනස් කරන නායකත්වයට පත්වන පරපුරක් අනිවාර්යයෙන්ම ඇතිකල යුතු, නිරායාසයෙන්ම ඇතිවිය යුතු අවංක බව, පරාර්ථකාමී බව, නිහතමානි බව, එකිනෙකාට එකිනෙකාගේ අදහස් වලට ගරු කල හැකි බව, එකිනෙකාට ස්තූතිවන්ත වීමේ හැකියාව, කාලගුණ සැලකීමේ බව, වැඩිහිටියන්ට, ගරුකටයුත්තන්ට ගරු කිරීමේ හැකියාව වැනි ඇතුලාන්තය ගොඩනැගීමේ කර්තව්‍ය සඳහා දශ පනතක් බුදු දහමේ අනුසාරය මුසුකොට ක්‍රියාත්මක කරණු ලැබූ අතර අද වන විට එහි පැහැදිලි ප්‍රතිඵල පෙනෙන්නට පටන්ගෙන තිබේ. පාසලේ උගන්වන සෑම විෂයක් සඳහාම ඒ ඒ විෂයන් හදාරන සිසු සිසුවියන් නියෝජනය කරන සමිතියක් සෑම මසකම විදුහල්පති තුමාගේ මූලිකත්වයෙන් හමුවී තම තමුන් දැනඋගත් දෑ පමණක් නොව අවශ්‍යතා අඩුලුහුඩු කම් පවා සාකච්ඡා කර ඒ අනුව ඉදිරි පාඨමාලා ගොඩනැගීම සිදුවේ.

රකින්නට පරපුරක්, තර කරන්නට බූදලයක් නැති එම දික්වැල්ල ප්‍රදේශය නැමති විලෙහි උපන් අරවින්දයක් බඳුවූ දික්වැල්ලේ ධම්ම විලාස හිමි මෙම විදුහලේ විදුල්පති තනතුරට පත්වුයේ අධ්‍යාපන දෙපාර්තමේනතුවේ අවශ්‍ය සුදුසුකම් සපිරීමෙන් මිසක එම ප්‍රදේශයේ උපන් නිසාවත් සඟරුවනක් වූ නිසාවත්, දේශපාලන බලවතුන්ට පන්දම් ඇල්ලීමෙන් වත් නොවේ. එනිසාම දේශපාලකයන්ගේ බලපෑමක් නොමැතිව ස්වයං තීරණ ගැනීමේ හැකියාව නිසා මෙම පාසල දියුණුවෙන් දියුණුවට පත්වෙමින් පවතී.

මේ සියළු කටයුතු සිදුවුවත්, පහසුකම් සැපයුවත් ආරම්භයේදී 1 වන වසර සිට 12 වන වසර දක්වා පන්ති පැවැත්වෙන මෙම විදුහලට 1 වන වසර සඳහා ඇතුළු වුනේ කුඩා දරුවන් 15ක් පමණ වීමත් සෑම දිනකම පාසලේ සිසුන්ගේ පැමිනීම දුර්වල වීමත්, පැමිනෙන දරුවන් පවා ක්ලාන්ත වීම්, අසනීප වීම් පිළිබඳව කරුණු විමසීමේදී බොහෝ දරුවන් පාසලට පැමිනෙන්නේ උදේ ආහාරයවත් නොමැතිව බවත් ආර්ථික දුෂ්කරතා මෙයට බලපා ඇති බවත් හෙලිදරව් කරගැනිනි.

ඒ අනුව පාසලේ සියළුම සිසු සිසුවියන්ට නොමිලේ පෝෂ්‍යදායී උදේ ආහාර වේලක් ලබා දීමේ කටයුතු ආරම්භ වුනත් මූල්‍යමය පහසුකම් නොමැති නිසා එය අතරමග නතරවන ලකුණු පහලවෙමින් තිබිනි.

මේ වන විට (වසර 2005) නිව්සවුත්වේල්ස් හි ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමය සුනාමි ඛේදවාචකය වෙනුවෙන් ලැබී තිබූ ආධාර සඳහා වඩා ප්‍රයෝජනවත්, ව්‍යාපෘතියක් පිළිබඳව අධ්‍යනය කරමින් සිටියේය. ඒ අනුව මෙම දික්වැල්ල උතුර මහා විද්‍යාලයේ ක්‍රියාත්මක වූ මහා ව්‍යාපෘතියේ අනුව්‍යාප්තියක් වූ "පෝෂ්‍යදායී උදේ ආහාර වේලක්" සඳහා බර පැන දැරීමට මෙම

20 වන පිටුවට

සුජීව මුදලිගේ
සිඩ්නි


**MODERN HOUSE FOR SALE IN MALABE SRI LANKA**

A Brand New house with all amenities including A/C and solar Hot Water. Consist of four Large Bedrooms, three Bathrooms, two pantries, dual garage, and large garden with remote control gates. All doors and windows are made out of teakwood (imported). Land extent of 26 Perches

50 metres from Malabe - Athurugiriya Highway.

Expected Price- AUD 190,000.00
RS. 20 Million

Contact
Telephone Sri Lanka - 0777-484588
Australia - 0432051798



**Skilled Migration**
**Post 1st September 2007**
**New rules are now in effect..**
It is imperative to obtain most precise and accurate advice for eligibility criterion..

Now we offer our services in Australia & Sri Lanka for individuals who possess genuine documents



We Deliver Results..



Susantha Katugampala L.L.B (Monash)
Barrister & Solicitor
Immigration Lawyer
Migration Agent Reg: 96-86306

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

*Melbourne office:*
Tel: 03 9650 4557 Mob: 417 851 041 Fax: 03 9650 4559
Interstate : 1300 888 331
10, Morrison Place,
East Melbourne 3002

*Colombo Office:*
Colombo Hilton Residence (JAIC Hilton Towers)
Ground Floor, 200, Union Place
Colombo 02
Contact: Dulani or Anjana 0777 347 670

Email: fairfields.lawyers@bigpond.com